// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2149/11 - 2019 නොවැම්බර් මස 13 වැනි බදාදා - 2019.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක - IR/COM/03/2016/128

### කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2017.12.26 දිනැති හා අංක 2051/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.12.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බුත්තල, ලංකා සීනි (පුද්ගලික) සමාගම, ආර්.ජී. කරුණාරත්න මයා (බාරේ) ආර්.එම්. පොඩිමැණිකා මිය සහ කොළඹ 04, මෙල්බන් ඇවනියු, අංක 27, සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.10.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්,

2019 ඔක්තෝබර් 29 දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/COM/03/2016/128

කාර්මික අධිකරණයේදී ය.

ආර්.එම්.පොඩිමැණිකා මිය,
ආර්.ජී. කරුණාරත්න මයා (බාරේ),
ලංකා සීනි (පුද්ගලික) සමාගම,
බුත්තල.

*(ඉල්ලුම්කාරිය)*

නඩු අංකය : ඒ/49/2017 සහ

සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම,
නො. 27,
මෙල්බන් ඇවැනියු,
කොළඹ 04.

*(වගඋත්තරකරු)*

### ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනවිරත්න මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 ( 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා ) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ජේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව ඉහත සඳහන් පාර්ශවයන් අතර කාර්මික ආරාවුලක් පවත්නා හෙයින් එකී කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ , මේල්පිටිය , නො.75, එස්. කාරියවසම් වන මා 2017.12.19 වන දින පත්කොට මෙම ආරවුල මා වෙත යොමුකර ඇත.

ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :-

''බුත්තල, පැලවත්ත සීනි සමාගමේ සේවිකාවක වශයෙන් සේවය කර විශ්‍රාම යැමෙන් අනතුරුව 2015.03.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී තිබූ වසරක කොන්ත්‍රාත් සේවා ගිවිසුම ආපසු ලබා ගෙන 2015.03.31 දින සිට ආර්.එම්. පොඩිමැණිකා මියගේ සේවය අවසන් කිරීමෙන් ඇයට අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඇයට හිමි විය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව'' වේ.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2018.04.27 දින නඩුව ආරම්භ කරමින් ඉල්ලුම්කාරිය වෙනුවෙන් එම්.කේ. හේමපාල මහතා පෙනී සිටි අතර වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් මහේන්ද්‍ර ඩයස් මහතා පෙනී සිටින ලදී.

ඉල්ලුම්කාරිය තමාගේ නඩුව ඉදිරිපත් කරමින් සිය මූලික සාක්ෂියේ දි පහත සඳහන් කරුණු හෙළිදරව් කර සිටියා ය.

එනම් :-

(අ) තමා පැලවත්ත සීනි සමාගමේ රැකියාව සඳහා 83.10.24 දින සේවයට බැඳුණු බව,

(ආ) තමන්ට අනියම් කම්කරු තනතුරක් ලැබූ බව,

(ඇ) තමා අවු. 55 න් විශ්‍රාම ගැන්වීමෙන් පසු තවදුරටත් කොන්ත්‍රාත් පදනම මත වසරක කාලයකට සේවය කිරීමේ පත්වීමක් ලබා දුන් බවය

(ඈ) එය ලැබුණේ 2015.03.09 දින සිට වසරකට එනම් මාස 12 ක සේවා කාලයකට බව,

(ඉ) තමාට ලබා දුන් පත්වීම් ලිපිය ආයතනයේ ලොකු මහත්තයාට බලන්න ගේන්න කියා මාගේ නිවසට පැමිණි ධර්මදාස මහතා විසින් රැගෙන යාමට ඉල්ලා සිටි බව,

(ඊ) ධර්මදාස මහතා තමාගේ පත්වීම් ලිපිය රැගෙන ගිය පසු ද, 2015.03.31 දින දක්වා සේවයේ යෙදීසිටි බව,

(එ) එසේ තමාගෙන් ලබාගත් පත්වීම ආපසු ලබා ගැනීමට කිහිප අවස්ථාවක පාලන අධිකාරිය වෙත ගිය නමුදු එය ලබා නොදුන් නිසා මොණරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත පැමිණිලි කළ බව,

(ඒ) අදාළ පාර්ශවයන් කැඳවා කම්කරු දෙපාර්තුමේන්තුව විසින් පවත්වන ලද පරීක්ෂණයෙන් අනතුරුව, තමාට ලබා දී ඇති පත්වීමේ ලිපියේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කරන ලෙසට වගඋත්තරකාර සමාගමට උපදෙස් ලබා දුන් බව,

(උ) එකී නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම නිසා පැමිණිල්ල බදුල්ල කලාප කාර්යාලය වෙත ද, පසුව කොළඹ කම්කරු සබඳතා අංශය වෙත ද, යොමු කිරීමෙන් පසු පැවති පරීක්ෂණයෙන් අනතුරුව විධිමත් ලෙස කොන්ත්‍රාත් සේවය අවසන් කර නොමැති බැවින් තමාට අහිමි කළ සේවා කාලය වූ මාස 11 දින 09 සඳහා තමාට හිමි වැටුප් ගෙවන ලෙස නිර්දේශ කළ බව,

(ඌ) සමාගම එම නිර්දේශ ද ක්‍රියාත්මක නොකිරීම නිසා මෙම අදළ පැමිණිල්ල මෙම බේරුම්කරණයට යොමු කළ බව,

(ඔ) මාස 12 ක් සඳහා මා හට ලබා දුන් කොන්ත්‍රාත් පත්වීම ආපසු ලබා නොදීම නිසා වැල්ලවාය පොලීසිය වෙත කරන ලද පැමිණිලි විභාගයේ දී , වගඋත්තරකාර සමාගම වෙනුවෙන් සහාභාගී වූ ධර්මදාස මහතා තමාගේ පත්වීම් රැගෙන ගිය බව පිළිගන්නා ලද නමුදු ඉන්පසු හෝ පත්වීමේ ලිපිය ආපසු ලබාදීමට කටයුතු නොකළ බව

ඉල්ලුම්කාරිය සිය මූලික සාක්ෂි අවසන් කරමින් මෙම බේරුම්කරණයෙන් පහත සඳහන් සහන,

එනම්,

i. 2015.03.03 දතමින් වගඋත්තරකාර ලංකා සීනි (පුද්) සමාගම විසින් 2015.03.09 දින සිට මාස 12ක කාලයක් සඳහා නිකුත් කරන ලද පත්වීම ප්‍රකාරව සේවය කිරීමට ඉඩ නොදී අහිමි කරන ලද මාස 11යි දින 09 ක සේවා කාලය සඳහා සම්පූර්ණ වැටුප වන රු.314,278/- ක මුදල ලබා දෙන මෙන්ද?

ii. ගරු බේරුම්කරණයට මැනවැයි හැඟෙන වෙනත් සහනයන් ලබා දෙන මෙන් ද;

අයැද සිටින බව ප්‍රකාශ කර සිටියා ය.

ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් කැඳවනු ලැබූ දෙවන සාක්ෂිකරු වූයේ කම්කරු කාර්යාලයේ දී ඇය වෙනුවෙන් පෙනී සිටි නියෝජිත ආර්.ජී. කරුණාරත්න නැමැති අය වේ. ඔහු ලබා දුන් සාක්ෂි මගින් ද ඉල්ලුම්කාරියගේ සාක්ෂි තවදුරටත් තහවුරු වී ඇත.

වගඋත්තරකාර ලංකා සීනි පුද්ගලික සමාගම වෙනුවෙන් නඩුව අරම්භ කරමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත්) සාක්ෂි ලබා දෙමින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කරන ලදි.

i. ඉල්ලුම්කාරිය 2015.03.09 දින සිට මාස 12 ක් සඳහා නිකුත් කළ කොන්ත්‍රාත් පත්වීම දින 08 කට ආපසු ඇයගෙන් ලබා ගත්තේ එහි ඇති වරදක් නිවැරැදි කිරීම සඳහා බව,

ii. එහෙත් එවැනි වරදක් නිවැරදි කිරීමට ගන්නා ලද කිසිදු පියවරක් සම්බන්ධයෙන් සාක්ෂිකරු කිසිදු සාධකයක් නඩු විභාගයේ දී තහවුරු නොකරන ලද බව,

වැඩිදුරටත් හරස් ප්‍රශ්න විමසීමේදි නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) කේ.ජී.එල් ප්‍රනාන්දු මහතා කියා සිටියේ,

ප්‍ර: ඉල්ලුම්කාරියට ලබා දුන්න R5 දරණ පත්වීම අනුව ඇය සේවයට වාර්තා කළා ද?

උ: ඔව්

ප්‍ර: ඒ අනුව ඇය සේවය කරමින් සිටිය දි දින 08 කට පසු ඇයගේ R5 දරණ පත්වීමේ ලිපිය ඇයගෙන් ලබාගෙන තිබෙනවා ද?

උ: ඔව්

ප්‍ර: R5 දරණ කොන්ත්‍රාත් පත්වීමේ සේවා කාලය අවසන් වන්නේ කවද ද?

උ: මාස 12කට පස්සේ 2015.03.09 සිට 2016.03.08 දින වෙනකම්.

ප්‍ර: 2016.03.08 වෙනිද තමයි R5 (ඉ/8) ලේඛනය අනුව ඇයගේ කොන්ත්‍රාත් පත්වීම අහෝසි වන්නේ?

උ: ඔව්.

R5 නොහොත් ඉ/8 දරන කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොමැති බව පිළිගනිමින් වැඩිදුරටත් හරස් ප්‍රශ්න වලට සාක්ෂිදුන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා ;

ප්‍ර : R5 කියන්නේ මේ සේවිකාව හා ආයතනය අතර ඇති කරගත් සේවා ගිවිසුම ?

උ : ඔව්.

ප්‍ර : මේ සේවා ගිවිසුම අනුව 8 වැනි කොන්දේසිය කියවන්න පුළුවන් ද?

උ : සාක්ෂිකරු කියවා සිටී.

ප්‍ර : R5 හෝ ඉ/8 දරන මේ ලේඛනයේ 8 වැනි කොන්දේසිය අනුව මේ මහත්මියගේ පත්වීම අහෝසි කරන බවට මාසයකට පෙර දැනුම් දී තිබෙනවා ද?

උ : නැහැ. දැනුම් දීලා නැහැ.

ප්‍ර : ඒ කියන්නේ සේවකයන්, සේවා ආයතනයන් අතර ඇති වෙච්ච සේවා ගිවිසුමේ 8 වැනි කොන්දේසිය අනුව කටයුතු කිරීමක් සිදුවෙලා නැහැ?

උ : නැහැ.
(2018.10.26 - කාර්ය සටහන් පිටු අංක 12, 14, 21 හා 22 බලන්න)

වග උත්තරකාර පාර්ශවය වෙනුවෙන් ආයතනයේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කෝවිල ලූක් ජයන්ත ප්‍රනාන්දු මහතා සාක්ෂි දෙමින් පහත කරුණු ඉදිරිපත් කොට ඇත.

(අ) තමා වගඋත්තරකාර සමාගමේ අවු. 33 ක කාලයක් මානව සම්පත් අංශයේ සේවය කළ බවත්,

(ආ) R5 දරන කොන්ත්‍රාත් ගිවිසුම පිළිගන්නා බවත්,

(ඇ) ඉ.6 ලිපිය අනුව ඉල්ලුම්කාරියගේ ලිපිය අනුව ගෙවනවා නම් රු.314278/- ක් ගෙවීමට ඇති බවත්, එහෙත් ඉ.6 අනුව රු.535906.78 ක් බව.

(ඈ) E14 (බී) ලෙස ලේඛන සළකුණු කොට ඉදිරිපත් කර තම සාක්ෂිය අවසන් කරන බවත් ප්‍රකාශ (පිටු අංක 224 කාර්ය සටහන්) ඉදිරිපත් කරමින් දීර්ඝ ලෙස සාක්ෂියක් ඉදිරිපත් කර ඇත.

වගඋත්තරකරුගේ ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනය අනුව පහත කරුණු ඉදිරිපත් කළ හැකි ය. එනම්,

i. ඉල්ලුම්කාරිය වෙත වගඋත්තරකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද පත්වීම් ලිපියෙහි යම් ඌණතාවයක් පැවැති බව,

ii. ඉල්ලුම්කාරියගේ පැමිණිල්ල කාලවරෝධයට ලක්ව ඇති බව,

iii. මෙම පැමිණිල්ල කම්කරු විනිශ්චය සභාව වෙත යොමු කළ යුතුව තිබූ බව,

iv. 2013.01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ වගඋත්තරකාර සමාගමට බලනොපාන බවත් එය සමාගමට සුදුසු ආකාරයට ක්‍රියාත්මක කිරීමට නිදහස පවත්නා බවත්, ඉල්ලුම්කාරියට වයස 60 දක්වා සේවය ලබා ගැනීමට නීත්‍යානුකූල අයිතියක් නොමැති බව.
ලිඛිත දේශනයේ 29 වන වගන්තිය අනුව ''වගඋත්තරකාර සමාගම විසින් මෙම නිකුත් කරන ලද කොන්ත්‍රාත් ලිපිය සාමාන්‍ය ක්‍රියා පටිපාටියෙන් බැහැරව මාස 06 ක කොන්ත්‍රාත් සේවයක් වෙනුවට වැරදීමකින් වසරක සේවයක් සඳහා කොන්ත්‍රාත් ලිපිය නිකුත් කර ඇති බව ප්‍රකාශ කර සිටියි'' යන්නෙන් දක්වා ඇත. ඉල්ලුම්කාරිය වෙත නිකුත් කරන ලද කොන්ත්‍රාත් ලිපියෙහි වැරදීමක් වගඋත්තරකරුවන් අතින් සිදුව ඇති නම් එකී වරදට දඬුවම් ලැබිය යුත්තේ මෙහි ඉල්ලුම්කාරිය දැයි පැනයකි. මෙම බේරුම්කරණයට බලපැවැත්වූ යොමුවට අදාළ නඩු නිමිත්ත මෙම වැරදීම යයි පැහැදිලි වේ.

v. තවදුරටත් 30 වන වගන්තිය අනුව ''මෙම අත්වැරදීම වගඋත්තරකාර ආයතනයේ සාමාන්‍ය ක්‍රියා පටිපාටියට පටහැනි බවත්, මෙය අත්වැරදීමකින් සිදුවී ඇති බව ඉල්ලමිකාරිය දැන සිටි බව ඉල්ලුම්කාරිය පිළිගෙන ඇති බවත් සාක්ෂි මෙහෙයවීමේ දී තහවුරු වී ඇත.'' (234 පිටුව - මුල් නඩු ගොනුව).

vi. 31 වගන්තිය අනුව තම අත්වැරැද්ද දැනගත් වහාම සතියකට පසුව ඉල්ලුම්කාරිය වෙත කරුණු ඉදිරිපත් කොට වරද නිවැරදි කිරීම සඳහා ඉල්ලුම්කාරිය සමඟ වාචික ගිවිසුමකට එළඹුණු බව,

vii. එසේ නොකළේ නම් විශ්‍රාම ගිය අන්‍ය සේවකයින්ට ද වසරක් බැගින් නැවත සේවය ලබා දීමට සිදුවුවහොත් කාර්මික ආරාවුලක් ඇති වීමට ඉඩ තිබූ බව,

viii. නැවත මාස 06 ක කාලයකට සේවය ලබා දීමට මෙහි ඉල්ලුම්කාරිය විමසීමෙන් ඊට ඇය අකමැති වූ බවත්,

ix. 34 වගන්තිය අනුව වසරක සේවා දිගුවක් දීමෙන් ආයතනයේ 3000 කට අධික සේවක සංඛ්‍යාවකට වසර බැගින් සේවා දිගු ලබා දීම ආයතනයට දරා ගත නොහැකි බවත්, ආයතනය වසා දැමීමට සිදුවන බැවින් එසේ නොකළ බවද?

x. එසේ හෙයින් ඉල්ලුම්කාරිය මොණරාගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත පැමිණිලි කළ බවත්, එකී පැමිණිල්ලේ දී පත්වීම් ලිපිය බලහත්කාරයෙන් ලබා ගත් බවට ප්‍රකාශ කර ඇතත් එසේ නොකළ බව,

xi. ඉල්ලුම්කාරිය වෙත පසු වේතන සහ/හෝ හිඟ වැටුප් ගෙවීමට ක්‍රියා කළහොත් දැනට විශ්‍රාම ගොස් සිටින සියයකට අධික සේවක පිරිසක් ද මෙවැනි ඉල්ලීම් කළ විට ආයතනය වසා දැමීමේ තත්ත්වයක් උදාවිය හැකි බවත්,

xii. එකී හේතුව මත මෙම ඉල්ලුම්කාරියගේ ඉල්ලීම හෙවත් යොමුවේ සඳහන් කරුණු මත ක්‍රියා නොකර සිටි බවත්,

xiii. ලිඛිත දේශනයේ 46 වන කරුණ මෙසේ ය. එනම් ''කෙසේ වුවත් ආයතනය, ඉල්ලුම්කාරිය හට සාධාරණයක් කිරීමේ චේතනාවෙන් වසරක සේවා දිගුවක් වාර දෙකකට දීමට තවදුරටත් එකඟ වන බව වගඋත්තරකරු ප්‍රකාශ කර සිටී.'' යන්නෙන් යොමුවේ සඳහන් වන ''බුත්තල පැලවත්ත සීනි සමාගමේ සේවිකාවක වශයෙන් සේවය කර විශ්‍රාම යාමෙන් අනතුරුව 2015.03.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී තිබූ වසරක කොන්ත්‍රාත් සේවා ගිවිසුම ආපසු ලබාගෙන 2015.03.31 දින සිට ආර්. එම්. පොඩිමැණිකා මියගේ සේවය අවසන් කිරීමෙන් ඇයට අසාධාරණයක් සිදුවී තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඇයට හිමි විය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වග උත්තරකරු යොමුවේ සඳහන් කරුණු පිළිගෙන ඇති බව පැහැදිලි වේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුම වෙනස් කර නැවත දීමේ අරමුණ ඇතිව ආපසු ලබා ගත් බව,

(ආ) එහෙත් සංශෝධිත ගිවිසුමක් මාස හයේ කාල පරිච්ඡේද දෙකකට වෙන් කොට ලබා දීමට ආපසු ගත් බව,

(ඇ) එහෙත් එසේ සංශෝධිත ගිවිසුමක් නැවත සකසා අත්සන් නොකළ බව පැහැදිලිය.

කොන්ත්‍රාත් ගිවිසුමේ 8 වගන්තිය ප්‍රකාරව සේවය අවසන් කළ බව ද, වගඋත්තරකාර පාර්ශවයේ තර්කයකි.

**ලිඛිත දේශනයේ 46 වගන්තිය මෙසේ ය.**

''කෙසේ වෙතත් ආයතනය ඉල්ලුම්කාරිය හට සාධාරණයක් කිරීමේ චේතනාවෙන් වසරක සේවා දිගුවක් වාර දෙකකට දීමට තවදුරටත් එකඟ වන බව වගඋත්තරකරු ප්‍රකාශ කර සිටියි.''

මේ අනුව ඉහත කී සම්ප්‍රකාශයෙන් වගඋත්තරකාර ආයතනය ප්‍රතිබන්ධනය වී ඇති බව පැහැදිලි ය. කරුණු එසේ

නම් ප්‍රදානය ලබා දීමේ දී මෙම කරුණ ද සිහියේ තබා ගත යුතුව ඇත.

**ලිඛිත දේශනයෙහි 54 වගන්තිය මෙසේ ය.**

''54. එකී ලිපිය ප්‍රකාරව 2015.03.31 දින සිට කවර හේතුවක් මත හෝ යලි දීර්ඝ නොකරන බවට කළමනාකාරිත්වය තීරණය කර ඇති බව සඳහන් වන අතර, එකී ශීර්ෂය හා අන්තර්ගතය මත ගම්‍ය වන්නේ ඉල්ලුම්කාරියගේ කොන්ත්‍රාත් කාලය අවසන් කර ඇති බවයි.''

මෙම වගන්තිය මෙම ලිඛිත දේශනයේ සඳහන් 46 වන වගන්තිය හා ගැටේ. 46 වගන්තියෙන් වසරක සේවා දිගුවක් (සාධාරණයක් කිරීමේ අරමුණින්) වාර දෙකකට දීමට තවදුරටත් එකඟ වන බව වගඋත්තරකරු ප්‍රකාශ කර සිටීමෙන් යොමුවේ සඳහන් කරුණ පිළිගත් බවත් ද?

ඒ අනුව ප්‍රදානය මෙසේ ඉදිරිපත් කරමි.

යොමුවේ සඳහන් කරුණු යළි සලකා බලමි. එනම්, බුත්තල පැලවත්ත සීනි සමාගමේ සේවිකාවක වශයෙන් සේවය කර විශ්‍රාම යාමෙන් අනතුරුව 2015.03.09 දින සිට ක්‍රියාත්මක වන පරිදි ලබා දී තිබූ වසරක කොන්ත්‍රාත් සේවා ගිවිසුම ආපසු ලබාගෙන 2015.03.31 දින සිට ආර්. එම්. පොඩිමැණිකා මියගේ සේවය අවසන් කිරීමෙන් ඇයට අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නට පිළිතුර අසාධාරණයක් සිදුව ඇති බවයි.

කොන්ත්‍රාත් ගිවිසුම අවිධිමත් ලෙස ආපසු ලබාගත් බව වගඋත්තරකාර පාර්ශවය විභාගයේ දී පිළිගෙන ඇත.

එසේ අසාධාරණයක් වී ඇති නම් ඇයට හිමිවිය යුතු සහන කවරේද යන්නට පිළිතුරු මෙසේ ලබා දීමට කැමැත්තෙමි.

ඒ අනුව ඉල්ලුම්කාර පාර්ශවය විසින් ලකුණු කරන ලද ඉ12 ලේඛනය හා වගඋත්තරකාර පාර්ශවය විසින් ලකුණු කරනු කරන ලද R8 ලේඛනය අනුව ඉල්ලුම්කාර ආර්. එම්. පොඩිමැණිකේ මහත්මිය වෙනුවෙන් 2015 මාර්තු 09 දින සිට 2016 මාර්තු 08 වන දින දක්වා මුළු හිඟ වැටුප රු.314,278.00 ක් වන බව තීරණය කරමි.

එනම් රුපියල් තුන් ලක්ෂ දාහතරදහස් දෙසීය හැත්තෑඅටක (රු.314,278/-) මුදලක් මෙම බේරුම්කරණ නඩුවේ වගඋත්තරකාර පාර්ශවය විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී මසක් ඇතුළත යථෝක්ත නඩුවේ ඉල්ලුම්කාරියට ගෙවීමට ඇති එම මුදල දකුණු කොළඹ කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙස නියෝග කරමි.

මෙය යුක්ති සහගත තීරණයක් බවට සහතික කරමි.

2019.10.17 වන දින කාර්මික අධිකරණයේ දී ය.

මෙයට,

එස්. කාරියවසම්,
බේරුම්කරු සහ නීතිඥ.

11 - 1544

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.